FACULTY OF GRADUATE STUDIES
RECEIVED
03 DEC 2009
UNIVERSITY OF KELANIYA

SC

FACULTY OF GRADUATE STUDIES
09 OCT 2009
UNIVERSITY OF KELANIYA

# බෙයිජිං ඔපෙරාව සහ සාම්ප්‍රදායික සිංහල නාට්‍ය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

නම : මා චූන් වූ
(MA ZHONG WU)
ශිෂ්‍ය අංකය : FGS / 04 / 01 / 08 / 2006 / 02



| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 575 |
| වර්ග අංකය | |



කැලණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර පීඨයේ
සිංහල දර්ශන විශාරද උපාධිය සඳහා
ඉදිරිපත් කරන ලදි.
2009 ඔක්තෝම්බර්

575

# සාරාංශය


බෙයිජිං ඔපෙරාව සහ සාම්ප්‍රදායික සිංහල නාට්‍ය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් මැයෙන් සමීක්ෂිත මෙකී නිබන්ධය සම්පාදනය උදෙසා බෙයිජිං ඔපෙරාව හෙවත් ප්‍රකට ව හැඳින්වෙන පීකිං ඔපෙරාව සහ සිංහල කවිනළුව අතර තුලනාත්මක අධ්‍යයනයක් සිදු කෙරෙයි. මෙය අනුගත ක්‍රමවේදය ලෙස පීකිං ඔපෙරා සහ සිංහල කවිනළු පිළිබඳ රචිත මූලාශ්‍රගත ග්‍රන්ථ, සංයුක්ත තැටි ආධාර කොට ගෙන මෙකී පර්යේෂණය සිදු කොට ඇත.

චීන නාට්‍ය කලාව ප්‍රාග් ඓතිහාසික යුගයෙහි සිට පැවත එන්නකි. එහි ප්‍රභවය හා විකාසනය කාලානුරූප ව වර්ධනය වූවකි. ඒ අතර පීකිං ඔපෙරාව චීන ජාතික නාට්‍ය විශේෂය ලෙස හැඳින්විය හැකි ය. එය දිගු කලක් පුරා විකාශිත ප්‍රාදේශීය නාට්‍ය විශේෂ කිහිපයක් පදනම් ව නිර්මාණය වූවකි. සාම්ප්‍රදායික සිංහල නාට්‍ය සිංහල ජන සමාජයේ පොදු අවශ්‍යතාවන් අනුව රංගගත වූවකි. මෙය සමාජයේ සෑම තරාතිරමකට ම අයත් පුද්ගලයන්ගේ සහයෝගය මත නොමිලයේ රඟ දක්වා ඇත. සිංහල කවිනළුව ඒ අතර ප්‍රමුඛ වේ.

මෙයින් ලබාගත් පොදු ප්‍රතිඵල ලෙස පීකිං ඔපෙරාව සහ සිංහල කවිනළුව සැසඳීමේ දී විවිධාංග යටතේ සමවිෂමතා හඳුනා ගත හැකි ය. එනම් පීකිං ඔපෙරාව හා කවිනළුවෙහි කලාත්මක ලක්ෂණ, රංග කලාව, නාට්‍ය සාහිත්‍යය, පිටපත් වර්ගීකරණය, පිටපත් ආකෘතිය සහ චරිත නිරූපණය, චරිත වර්ගීකරණය, පාත්‍ර වර්ගීකරණය, සංගීතය, රංග භූමිය, මුහුණු වර්ණ ගැන්වීම්, වස්ත්‍රාභරණ යනාදියෙහි මෙකී ලක්ෂණ හඳුනාගත හැකි ය. එසේ ම පීකිං ඔපෙරාව සහ සිංහල කවිනළුවෙන් පිළිබිඹු වන පුරුෂාර්ථ ද වැදගත් වේ.

මෙයින් එළැඹුණු ප්‍රධාන නිගමනය ලෙස සාම්ප්‍රදායික සිංහල නාට්‍ය විශේෂ අතර යම් උසස් බවක් සිංහල කවිනළුව ප්‍රකට කරන අතර ඇතැම් ලක්ෂණ හමුවේ පීකිං ඔපෙරාව හා සාම්‍ය වන බව නිගමනය කළ හැකි ය.